**ශීර්ෂය 233- ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 233 - ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූලි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු ය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ පොත් අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ ආරම්භක ශේෂය රු.22,438,708 ක් ද, භාණ්ඩාගාර මුද්‍රිත සටහන් **(SA 52)** අනුව රු.22,459,367 ක් ද, වීමෙන් ආරම්භක ශේෂ අතර රු.20,659 ක වෙනසක් නිරීක්ෂණය විය. 1996 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එනු ලබන මෙම වෙනස සමාලෝචිත වර්ෂයේදී ද නිවැරදි කිරීමට කටයුතුකර නොතිබුණි. | මෙම ශේෂ අතර රු.20,659 ක වෙනසක් ඇති බවත්, එම වෙනස 1996 වර්ෂයට පෙර සිට පෙන්නුම් කරනු ලබන ශේෂ වෙනසක් වන බැවින් 2023 වර්ෂයේදී මෙන්ම 2024 වර්ෂයේදී ද එම වෙනස පොත්වලින් ඉවත් කිරීමට අනුමැතිය දෙන ලෙස මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලුම්කර ඇති බව දන්වා තිබුණි. | නිවැරදි වටිනාකම් පොත්වලට ඇතුළත් කිරීමට වගබලා ගත යුතු ය. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| Zero Air Generator මැෂින් තුනක්, CPU අටක් සහ Pen drive තුනක් අපහරණය කර තිබුණ ද, ඉන් Zero Air Generator මැෂින් එකක, CPU ඒකක හතරක සහ Pen drive එකක ගත් මිල පොත්වලින් (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් (**SA 82**) ඉවත් කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම්වල නිවැරදි අගයක් පිළිඹිබු නොවී ය. | 2023 වර්ෂයේදී Zero Air Generator මැෂින් 02 ක් CPU 04 ක් හා Pen Drive 02 ක් ඇතුළු භාණ්ඩ 96 ක් අපහරණය කර රු.3,835,421 ක් වූ වටිනාකමක් මූල්‍ය නොවන වත්කම් වලින් ඉවත් කර ඇති අතර, එය භාණ්ඩාගාර මුද්‍රිත සටහන් SA - 82 වගුවෙහි පැහැදිලිව පෙන්නුම් කර, අවසන් ගිණුමේ 24 වන පිටුවෙහි එම තොරතුරු ඇතුළත් බව දන්වා තිබුණි. | නිවැරදි වටිනාකම් පොත්වලට ඇතුළත් කිරීමට වගබලා ගත යුතු ය. |

**(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **හානි පිළිබඳ ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනකර නොතිබුණි. | හානි පාඩු ලේඛනය නිවැරදිව යාවත්කාලීනකර ඇති බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතු ය. |

**(ඈ) විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත්කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළදී අනතුරුවලට භාජනය වූ වාහන දෙකකට අදාළ ලිපිගොනු විගණනයට ඉදිරිපත්කර නොතිබුණි. | අදාළ ලිපිගොනු මුදල් රෙගුලාසි 104 වාර්තා ලබාදීම සඳහා පත් කළ කමිටු නිලධාරීන්ට භාරදී ඇති අතර, මේ වන තෙක් වාර්තා ලැබී නැති නිසා එම ලිපිගොනු විගණනයට ඉදිරිපත් කිරීමට නොහැකි වූ බව දන්වා තිබුණි. | විගණනයට අදාළ ලිපිගොනු ලබාදීමට කටයුතු කළ යුතු ය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හා 2022 අප්‍රේල් 26 දිනැති රාජ්‍ය වියදම් පාලනය කිරීම පිළිබඳ චක්‍රලේඛයෙහි 03(xvii) වගන්තිය අනුව වර්ෂය තුළ වියදම් දැරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවල ඉතිරිවීම් ඇත්නම්, ඒවා වර්ෂය අවසන්වීමට පෙර වෙනත් වියදම් සඳහා යොදවා | ඇස්තමේන්තු කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයම වාර්ෂික අයවැය මගින් වෙන් නොකිරීම, නඩු භාණ්ඩ වැඩි ප්‍රමාණයක් සම්බන්ධයෙන් විශ්ලේෂණ වාර්තා නිකුත් කිරීම හා වර්ෂය තුළදී භාණ්ඩ හා සේවා මිල ඉහළ යාම ආදී හේතු නිසා වියදම් | යොමුගත චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | නොගත යුතු වුව ද, පුනරාවර්තන වැය විෂයයන් 02 ක රු.9,750,000 ක් මුදල් රෙගුලාසි මඟින් වෙනත් වැය විෂයයන් සඳහා මාරුකර තිබුණි. | කළමනාකරණය කරගත නොහැකි වීම මත, ඉතිරිවීම් තිබූ වැය විෂයයන් මගින් ප්‍රතිපාදන මාරු කිරීමට සිදු වූ දන්වා තිබුණි. | |
| (ආ) | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් අයවැය ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙලකර, සලසා ඇති ප්‍රතිපාදන සීමාවන් තුළම වියදම් කළමනාකරණය කරගැනීමට කටයුතු කළ යුතු වුව ද, සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 5 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයට අමතරව මුදල් රෙගුලාසි 66 සහ පරිපූරක ඇස්තමේන්තු යටතේ වෙනත් අරමුණු සඳහා වෙන්කළ රු.35,750,000 ක ප්‍රතිපාදන මාරුකර තිබුණි. වැය විෂයයන් අතර එලෙස මාරු කිරීමේ ප්‍රතිශතය සියයට 4 සිට සියයට 68 අතර පරාසයක් ගෙන තිබුණි. | ධාවනයේ යෙදෙන වාහන ඉතා පැරණි ඒවා බැවින් අලුත්වැඩියාවන් සඳහා දරනු ලබන වියදම ඉහළ යාමත්, නිමකළ විශ්ලේෂණ වාර්තා ඉහළ යාම නිසා තැපැල් වියදම් ඉහළ යාමත් සහ 2023 වර්ෂයේදී ලැබුණු නඩු භාණ්ඩ ප්‍රමාණය ඉහළ යාම නිසා නව මත්ද්‍රව්‍ය විද්‍යාගාරයක් තාවකාලිකව ස්ථාපිතකර, එම අංශයේ නඩු භාණ්ඩ ගබඩා කිරීමට අවශ්‍ය භාණ්ඩ හා නව වාර්තා මුද්‍රණය වෙනුවෙන් අවශ්‍ය පහසුකම් සලසාගැනීමටත් අවශ්‍ය ප්‍රතිපාදන, මුදල් රෙගුලාසි 66 මගින් මාරු කරගත් බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතු ය. |
| (ඇ) | අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන පූර්ව සැලැසුම් සකස්කර ප්‍රතිපාදන වෙන්කර නොගැනීම සහ මනා කළමනාකරණයකින් යුක්තව ප්‍රතිපාදන වැය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ වැය විෂයයන් පහක් සඳහා වෙන් කරන ලද රු.139,000,000 ක ප්‍රතිපාදන සියයට සියයම ඉතිරි වී තිබුණි. | කොයිකා ව්‍යාපෘතියට අදාළව ශ්‍රී ලංකාවේ අපරාධ යුක්තිය පසිඳලීමේ පද්ධතිය තුළ අධිකරණ වෛද්‍ය විශ්ලේෂණයේ ධාරිතාව ගොඩනැඟීම ශක්තිමත් කිරීමේ වැඩසටහනට අදාළව වෙන් කරවා ගන්නා ලද රු.139,000,000 ක ප්‍රතිපාදන ඉතිරි වී ඇති අතර, අදාළ ව්‍යාපෘතිය යටතේ ලැබෙන වත්කම් හා ඒ ආශ්‍රිත වියදම් ගිණුම්ගත කිරීම සඳහා වෙන් කළ ද, නියමිත කාලසීමාව තුළදී එම කටයුතු සිදු නොවූ නිසා මෙලෙස ප්‍රතිපාදන ඉතිරි වූ බව දන්වා තිබුණි. | නිසි අධ්‍යයනයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු ය. |

**2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම**

| | විගණන නිරීක්ෂණය | ගණකාධිකාරී නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව මගින් දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදන වෙන්කර නොමැති වැය විෂයයක් සඳහා (1405) රු.712,971 ක බැරකම්වලට එළඹී තිබුණි. | පිරිසිදු කිරීම් හා සේවාවලට අදාළ ප්‍රතිපාදන 2023 වර්ෂයේදී 233-1-1-0-1409 වැය විෂයයට වෙන් කළ ද, 2024 වර්ෂයේදී මහා භාණ්ඩාගාරය විසින් එම වැය විෂයය වියදම් වර්ග කීපයක් අතර වෙන්කර තිබූ නිසා, එම වැය විෂයයන්ට අදාළව බැරකම්ද සටහන් කරන ලද බව දන්වා තිබුණි. | නිවැරදි වැය විෂයයන්වලට අදාළ වටිනාකම් පොත්වලට ඇතුළත් කළ යුතු ය. |
| (ආ) | භාණ්ඩාගාර මුද්‍රිත සටහන් (SA 92) අනුව වැය විෂයයක් සඳහා රු.85,589,829 ක බැරකම්වලට එළඹී තිබූ නමුත්, එම බැරකම් දෙපාර්තමේන්තුවේ බැරකම් ලේඛනයේ ඇතුළත්කර නොතිබුණි. | 233-1-1-1-2103 යටතේ දක්වා ඇති රු.85,589,829 ක වටිනාකම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ගිණුම්ගත කරන ලද වියදමක් වන අතර, එය 2023 වර්ෂයේ බැදීමක් ලෙස දක්වා ඇත්තේ වැරදීමකින් බව දන්වා තිබුණි. | සියලුම බැරකම් ලේඛනයේ ඇතුළත් කළ යුතු ය. |
| (ඇ) | මු.රෙ. 94 (1) ප්‍රකාරව වෙනත් ආකාරයකට විධිවිධාන සලසා ඇති අවස්ථාවලදී හැර වාර්ෂික ඇස්තමේන්තුවල ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ඇත්නම් විනා කිසිම දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැදීමකට හෝ නොබැදී සිටිය යුතු වුව ද, සමාලෝචිත වර්ෂයේ මූලධන වැය විෂයයන් 02 ක් සඳහා ප්‍රතිපාදන ඉතිරිය ඉක්මවා රු.446,170 බැරකම්වලට එළැඹී තිබුණි. | එලෙස බැදීම්වලට එළඹ ඇත්තේ මු.රෙ. 94 (2) යටතේ ඇති ප්‍රතිපාදන අනුව බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ බැදීම් හා බැරකම් ප්‍රකාශනයේ හා බැරකම් ලේඛනයේ ඇතුළත් නොවූ රු.54,480 ක බැරකම් 2024 වර්ෂයේදී නිරවුල්කර තිබුණි. | 233-01-01-01-1301 වැය විෂයය යටතේ සඳහන් රු.21,300 ක් සහ රු.26,000 ක් ඇතුළත් වාහන අලුත්වැඩියා වියදම් බැරකම් | වර්ෂයට අදාළ සියලු බැරකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | | ලේඛනයේ ඇතුළත් විය යුතුව තිබූ වියදම් දෙකක් බව පිළිගන්නා අතර, 223-1-1-0-1201 වැය විෂයයෙන් ගෙවන ලද පුවත්පත් බිල්පතේ ඉන්වොයිසි දිනය 2024 වර්ෂයේ බව දන්වා තිබුණි. | |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී මිලදී ගන්නා ලද රු.85,589,829 ක් වටිනා යන්ත්‍රයක් වියදම් ප්‍රකාශනයේ (ACA -2(ii)) මුදල් පොතට අනුව වියදම තීරුවේ හා බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ (ඇමුණුම (iii)) ගෙවිය යුතු බැරකමක් ලෙස දක්වා තිබුණි. | 2023 වර්ෂයේ ප්‍රතිපාදන යටතේ ලැබුණු රු.85,589,829 ක් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ගිණුම්ගත කරන ලද අතර, එම ගනුදෙනුව වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් තාවකාලිකව තබන ලද බැඳීම් සටහන ඉවත් නොකිරීම මත එය බැරකම් ලේඛනයට ඇතුළත්ව තිබූ බව දන්වා තිබුණි. | නිවැරදි වටිනාකම් ගිණුම් පොත්වලට ගැනීමට කටයුතු කළ යුතු ය. |

## 2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්**,** ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්**,** එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්**,** එවැනි | විගණන නිරීක්ෂණය සම්බන්ධයෙන් අදහස් දක්වා නොමැත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ii) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.2 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණක තනතුර 2023 වර්ෂයේදී පුරප්පාඩුව පැවති බැවින් අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් දෙපාර්තමේන්තුව අධීක්ෂණය කරනු ලබන බව දන්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | නිරීක්ෂණය වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | 104 (4) | - | වාහන අනතුරු සම්බන්ධයෙන් යොමුගත මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අදාළ විෂයභාර නිලධාරියාට වාචිකව උපදෙස් දී ඇති අතර, ලිඛිත උපදෙස් ලබාදීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතු ය. |
| | 772 (2) (ආ) | 74,155 | භාණ්ඩ වෙන්දේසියේදී වෙන්දේසි කරන ලද භාණ්ඩවලට අදාළ ලේඛනයෙහි කමිටු සාමාජිකයන් විසින් | වෙන්දේසියෙන් පසු අදාළ ලැයිස්තු දෙකටම අත්සන් ලබාගැනීමක් සිදු නොවූ අතර, 2024 වර්ෂයේ සිට එලෙස | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතු ය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | අත්සන්කර නොතිබුණි. | කටයුතු කිරීමට සටහන් කරගත් බව දන්වා තිබුණි. | |
| | 772 (ඉ) | - | විකුණන ලද භාණ්ඩ ද, ඒවාට ලැබුණු මිල ගණන් ද, විනාශ කරන ලද භාණ්ඩ ද පිළිබඳව මණ්ඩලයේ සාමාජිකයෙකුගේ සහතිකයක් මණ්ඩලයේ වාර්තාවට අමුණා නොතිබුණි. | වෙන්දේසි කරන ලද භාණ්ඩ මිල ගණන් ඇතුළත්කර වෙනම වාර්තාවක් අත්සන් කර නොගත් අතර, ඉදිරියේදී එලෙස කටයුතු කිරීමට උපදෙස් ලබාදුන් බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතු ය. |
| | 1646 | - | දෙපාර්තමේන්තුවට අයත් වාහන 24 ක් සඳහා 2022 සහ 2023 වර්ෂවලට අදාළ ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා ඉදිරිපත්කොට නොතිබුණි. | නිසි පරිදි ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතු ය. |
| (ii) | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ 2023 නොවැම්බර් 30 දිනැති අංක 2023/05 දරන මාර්ගෝපදේශයෙහි 6 ඡේදය | -- | වාර්තාකරන ආයතනයේ වාර්තාවලට අදාළව තොරතුරු නොමැති අවස්ථාවල හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුව ද, පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශනය සහ අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශනය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය ප්‍රකාශන තුළ හිස් වාර්තා ඉදිරිපත්කර නොතිබුණි. | පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශයට හා අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කිරීම සඳහා පොත්වලින් කපා හැරීම හා අස්ථානගත වූ වවුචර් නොතිබුණු නිසා හිස් වාර්තා ඉදිරිපත්කර නොතිබුණු අතර, ඉදිරියේදී එම තත්ත්වය නිවැරදි කිරීමට උපදෙස් ලබාදුන් බව දන්වා තිබුණි | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කළ යුතු ය. |

## 2.5 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 9.1 (ආ) හා මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන්කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු වුව ද, නිලධාරින් විසින් අවස්ථා 27 කදී ලබාගත් රු. 764,000 ක අතුරු අග්‍රිම පියවීමට දින 12 සිට දින 49 දක්වා කාලපරාසයක් ප්‍රමාදකර තිබුණි. | මේ සම්බන්ධයෙන් සියලුම නිලධාරීන් 2023 වර්ෂයේදී දැනුවත් කරන ලද අතර, එලෙස අත්තිකාරම් ලබා ගන්නා සංග්‍රහ කටයුතු දින ගණනාවක් පුරා පැවැත්වෙන අවස්ථාවලදී සහ පරිගණක උපාංග හා විදුලි උපාංග ආදිය වෙළඳසැල් ගණනාවකින් සොයා බලා මිලදී ගන්නට සිදුවන අවස්ථාවලදී මෙසේ නැවත පියවීම ප්‍රමාදවීම සිදුවන බව දන්වා තිබුණි. | අදාළ චක්‍රලේඛ ප්‍රකාරව නියමිත කාලවලදී අග්‍රිම පියවීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | අදාළ වියදම නිසියාකාරයෙන් ඇස්තමේන්තු කිරීමකින් තොරව අත්තිකාරම් මුදල් ලබාගෙන තිබූ අතර, ඒ අනුව ලබාගත් මුදල් හා වියදම් කළ මුදල් අතර සියයට 27 සිට සියයට 76 ක පරාසයක ඉතිරිවීම් පැවතුණි. | අවශ්‍යතාව ඇස්තමේන්තුකර අධිඇස්තමේන්තු නොකරන ලෙස නිලධාරීන් දැනුවත්කර ඇති අතර, ඉදිරියේදී ලබාගන්නා අත්තිකාරම්වලින් සියයට අසූවක්වත් වියදම් නොකළහොත් ඒ සම්බන්ධයෙන් කරුණු පැහැදිළි කිරීමක් අත්තිකාරම් පියවන අවස්ථාවේදී ඉදිරිපත්කරන ලෙස ලබාගන්නා නිලධාරීන් දැනුවත් කිරීම ආරම්භ කළ බව දන්වා තිබුණි. | අග්‍රිම අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ඒ අනුව කටයුතු කළ යුතු ය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සියලුම දෙපාර්තමේන්තු අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස්කළ යුතු අතර, ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස්කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වුව ද, සමාලෝචිත වර්ෂය සඳහා සකස්කර ඇති ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලද දිනය සඳහන්කර නොතිබුණු අතර, ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අනුමැතිය ද ලබාගෙන නොතිබුණි. | 2023 වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස්කර අමාත්‍යාංශය වෙත 2022 දෙසැම්බර් 20 දින ඉදිරිපත් කළ අතර, අනුමත කළ පසු පිටපතක් දෙපාර්තමේන්තුව වෙත ලැබී නොතිබුණු බව දන්වා තිබුණි. | ක්‍රියාකාරි සැලැස්ම නියමිත දිනට සකස්කර ඉදිරිපත් කළ යුතු ය. |
| (ආ) | යථෝක්ත චක්‍රලේඛයේ 03 ඡේදයේ මාර්ගෝපදේශ අංක 12 ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ වගකීම් ක්ෂේත්‍රය හා වර්ෂය තුළදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන කාර්යයන් පැහැදිළිව සඳහන්කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම තුළ වාර්ෂිකව ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන කාර්යයන් පැහැදිළිව දක්වා නොතිබූ බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතු ය. |
| (ඇ) | 2023 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචිත වර්ෂය තුළදී සංශෝධනය කර තිබුණ ද , ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | විගණන නිරීක්ෂණය සම්බන්ධයෙන් අදහස් දක්වා නොතිබුණි. | අදාළ අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතු ය. |

## 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාග්ධන ක්‍රියාකාරකම් හයක් සඳහා රු.මි 225 ක් වෙන්කර තිබුණ ද, එම ක්‍රියාකාරකම් ක්‍රියාවට නංවා නොතිබුණි. | කොයිකා ව්‍යාපෘතියට අදාළව වෙන්කරවා ගන්නා ලද රු.139,000,000 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබූ අතර, ව්‍යාපෘතිය යටතේ වත්කම් මිලදී ගැනීමේ ක්‍රියාවලිය හා ගොඩනැගිලි නවීකරණය නියමිත කාලසීමා තුළ සිදු නොවූ නිසා මෙලෙස ප්‍රතිපාදන ඉතිරි වූ බව දන්වා තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ කාර්යයන්ට ප්‍රමුඛතාවයදී කටයුතු කළ යුතු ය. |

## 3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුවේ අංශ 12 ක් සඳහා නඩු 12,189 ක් පරීක්ෂණයට භාජනය කර විශ්ලේෂණ වාර්තා නිකුත් කිරීම සඳහා ඉතිරි වී තිබුණු අතර, තවත් නඩු 58,886 ක් ලැබී තිබුණි. මින් 2023 වර්ෂය තුළදී වාර්තා කළ නඩු සංඛ්‍යාව 53,253 ක් වූ අතර, වර්ෂය අවසානයේදී විශ්ලේෂණය කර වාර්තා ඉදිරිපත් කිරීම සඳහා නඩු 17,822 ක් ඉතිරි වී තිබුණි. එය 2023 වර්ෂය තුළ ලැබුණු පරීක්ෂණයට භාජනය කර විශ්ලේෂණ වාර්තා නිකුත් කිරීම සඳහා | සමස්ථ කාර්ය මණ්ඩලය 350 ක් වන අතර, දැනට පුරප්පාඩු තනතුරු 110 න් 31 ක් ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ වන බවත් එවැනි තත්ත්වයක් මත, 2023 වර්ෂයේදී විශ්ලේෂණයට තිබූ නඩු 71,075 න් නඩු 53,253 ක් වර්ෂය තුළ විශ්ලේෂණය කළ බවත්, එය වර්ෂයේ සමස්ත නඩු ප්‍රමාණයෙන් සියයට 75 ක් පමණ වන බවත් දක්වා තිබුණි. | කාර්ය මණ්ඩල ගැටලු විසඳාගෙන මෙම නිමවුම් මට්ටම වැඩිකර ගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | තිබූ නඩු සංඛ්‍යාවෙන් සියයට 30 ක් විය. | | |
| (ආ) | මෙසේ විමර්ශනයකර වාර්තා ඉදිරිපත් කිරීමට තිබූ නඩු ප්‍රමාණයෙන් 885 ක් වර්ෂ 2014 සිට වර්ෂ 2020 දක්වා කාලපරිච්ඡේදයට අදාළ ඒවා බව නිරීක්ෂණය විය. | විශ්ලේෂණවලට අදාළ අසම්පූර්ණ තොරතුරු හා අසම්පූර්ණ ලෙස නඩුභාණ්ඩ ඉදිරිපත්කිරීම යනාදී හේතු නිසා තවමත් විශ්ලේෂණය නිමකිරීමට නොහැකි වූ නඩු භාණ්ඩ ප්‍රමාණයක් ඇති බවත්, පැරණි නඩුභාණ්ඩ විශ්ලේෂණයට ප්‍රමුඛත්වය ලබාදෙන ලෙස අංශ ප්‍රධානීන්ට උපදෙස්දී ඇති බවත් දන්වා තිබුණි. | පැරණි නඩු ප්‍රමාණය ඉක්මනින් විසඳා ගැනීමට කටයුතු කළ යුතු ය. |

## 3.4 විදේශ ආධාර ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 - 2024 කාලසීමාව සඳහා කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (KOICA) මඟින් දෙපාර්තමේන්තුවේ ධාරිතා වර්ධනය කිරීම සඳහා ඇමෙරිකන් ඩොලර් මිලියන 4.5 ක ප්‍රදානයක් ලබාදී තිබූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා රු.මි.100 ක් ඇස්තමේන්තුකර තිබුණ ද, KOICA ආයතනය විසින් කිසිදු වියදමක් වාර්තාකර නොතිබුණි. | 2023 වර්ෂයට අදාළව ව්‍යාපෘති කාර්යාලය විසින් කිසිදු වියදමක් වාර්තා නොකරන ලද බව දන්වා තිබුණි. | විදේශ ආධාර මත ලැබෙන මෙම මුදල් අපේක්ෂිත කාර්යයන් සඳහා කාර්යක්ෂමව යොදා ගැනීමට කටයුතු කළ යුතු ය. |

**3.5 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2018, මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම් මාර්ගෝපදේශයේ 1.3.4 අනුව වාහනයකට සිදු වූ අනතුරකදී රු. ලක්ෂ 05 කට වඩා වැඩි අලුත්වැඩියා වියදමක් දරන්නට සිදුවුවහොත් අලුත්වැඩියාවෙන් පසු එහි වටිනාකම තක්සේරු කළ යුතු අතර, එම තක්සේරු වටිනාකම වාහනයේ වටිනාකම ලෙස සැලකිය යුතු වුවද, වාහනයක් අනතුරින් පසු රු.2,835,853 ක් දරා අලුත්වැඩියාවකර තිබුණද, අලුත්වැඩියාවෙන් පසු එම වාහනය තක්සේරුකර වටිනාකම ලබා ගැනීමට කටයුතුකර නොතිබුණි. | මෙම වාහනය නියෝජිත ආයතනයක් වෙතින් අලුත්වැඩියාකර ලබාදී ඇති අතර, තක්සේරු වාර්තාව ලබාගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ආ) | යථෝක්ත මාර්ගෝපදේශයේ 2.3, 3.3.1 සහ 4.3 ඡේද ප්‍රකාරව සෑම වර්ෂ 05 කට වරක්ම ඉඩම් හා ගොඩනැගිලි, කාර්යාල උපකරණ හා ගෘහභාණ්ඩ සහ පිරියත හා යන්ත්‍රෝපකරණ සඳහා නැවත තක්සේරු කිරීමක් සිදුකළ යුතු වුව ද, දෙපාර්තමේන්තුව විසින් එසේ කටයුතුකර නොතිබුණි. | ස්ථාවර වත්කම් නැවත තක්සේරු කිරීමට අදාළ මාර්ගෝපදේශ අනුව සිදු නොකළ බව පිළිගන්නා බවත්, 2024 වර්ෂයේදී සිදු කිරීමට නියමිත බවත් දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

## 3.6 රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ නිලධාරීන් ඇප තැබීම පිළිබඳ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 9 වන ඡේදයේ සංශෝධිත මුදල් රෙගුලාසි 880 අනුව රජයේ නිලධාරීන්ට ඇප තැබීම පිළිබඳව රාජ්‍ය මුදල් ආදියේ භාරකාරත්වය හා ආරක්ෂාව සම්බන්ධයෙන් වූ වගකීම ගණන්දීමේ නිලධාරියා සතුව පවතින බැවින් නියමිත නිලධාරීන් විසින් ඇප තබන බවට වගබලා ගැනීම කළ යුතු යැයි සඳහන්කර තිබුණ ද, මුදල් රෙගුලාසි 315 හි ඇප තැන්පත් කළ යුතු ගණකාධිකාරී, මුදල් අයකැමි හා ගබඩා භාරකරු වැනි තනතුරු දරන නිලධාරීන් අදාළ ඇප මුදල් තැන්පත්කර නොතිබුණි. | අධිකරණ අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදී සාකච්ඡා වූ පරිදි රජයේ නිලධාරීන්ගේ ඇප තැබීමේ ආඥා පනත සංශෝධනය කිරීමට නියමිත බවත්, ඒ අනුව ඉදිරියේදී රජයේ නිලධාරීන්ගේ ඇප තැබීම සම්බන්ධයෙන් තීරණය ගන්නා බවත් සඳහන් වූ නිසා එතෙක් ඇප තැබීමේ කටයුතු සිදු නොකරන ලද බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

## 3.7 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ 2003 පෙබරවාරි 14 දින සිදුවූ ගිනි අනතුරින් වූ රු.2,229,111 ක් වූ හානිය, පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ සඳහන් කර තිබුණ ද, එය අයකර ගැනීමට හෝ පොත්වලින් ඉවත් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතුකර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව සතුව පවතින ගොනුවේ අලාභයේ ප්‍රමාණය සකස් වූ ආකාරය සඳහන්ව නොමැති අතර, මෙම අලාභය අයකර ගැනීමට පාර්ශවයක් පරීක්ෂණවලදී හඳුනාගෙන නොමැති බැවින් පොතෙන් කපාහැරීමේ බලය ලබාගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | හානි හා පාඩු අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට කටයුතු කළ යුතු ය. |

## 3.8 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැඩ තහනම්කර ඇති නිලධාරිනියකගෙන් වසර 10 කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතු රු.18,754 ක ආපදා ණයශේෂය හා නිලධාරියකුගෙන් වසර 03 කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතු රු.2,400 ක විශේෂ අත්තිකාරම් ණයශේෂය සමාලෝචිත වර්ෂය තුළදී ද අයකර නොතිබුණි. | මෙම වැඩ තහනම්කර ඇති නිලධාරීන්හට ණය ශේෂය පියවන ලෙස දැනුම්දී ඇති නමුත්, අදාළ ගෙවීම් නිරවුල් නොකරන ලද අතර, නිලධාරීන් දෙදෙනා හා සම්බන්ධ නඩු කටයුත්ත තවම විභාගවෙමින් පවතින නිසා නැවත සේවයේ පිහිටුවීමක් ද කළ නොහැකි බව දන්වා තිබුණි. | අයවිය යුතු ණයශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් දෙදෙනෙකුගේ එකතුව රු.427,345 ක් වූ ණයශේෂ අය කරගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් කටයුතුකර නොතිබුණි. | එක් නිලධාරිනියක් 2024 මාර්තු මස නැවත සේවයේ පිහිටුවා ඇති නිසා හිඟ ණය හා පොළිය 2024 වර්ෂයේ මාර්තු මස සිට නැවත අය කිරීම ආරම්භකර ඇති අතර, අනෙක් නිලධාරිනියගෙන් අය විය යුතු ණයශේෂය පියවන ලෙස දැනුම් දුන් බව දන්වා තිබුණි. | අයවිය යුතු ණයශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | 2019 ජුනි 27 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2019 හි 03(අ) ඡේදය ප්‍රකාරව නිලධාරියෙක් මාරු වී පැමිණ මාස දෙකක් ගත වීමෙන් පසු හෝ නිලධාරියෙක් මාරු වී ගොස් මාස තුනක් ගතවීමෙන් පසු දෙපාර්තමේන්තු අතර නිරවුල් නොවූ ණයශේෂ නොපෙන්වීමට වගබලා ගත යුතු වුව ද, දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරු වූ නිලධාරින් හත් දෙනෙකුගේ එකතුව රු.1,429,506 ක් වූ ණය ශේෂ නිරවුල්කර ගැනීම සඳහා මාස 04 සිට 11 දක්වා කාලයක් ගත වී තිබූ අතර, ස්ථාන මාරු වී පැමිණි නිලධාරින් පස් දෙනෙකුගේ එකතුව රු.1,064,668 ක් | මෙසේ ණයශේෂ නිරවුල් කරගැනීම කාලප්‍රමාදයක් ඇතුව සිදු වී ඇති බවත්, මෙම ණයශේෂ නිරවුල් කරනුයේ අදාළ දෙපාර්තමේන්තුවෙන් බවත්, නිලධාරීන් විශ්‍රාම යාම නිසා අත්තිකාරම් බී ගිණුම හා සරප් රාජකාරී ඉටු කරනු ලබන්නේ එකම නිලධාරියකු බවත්, අවම වශයෙන් වසර තුළ එම ණයශේෂ පවරාදීම හා පවරාගැනීම නිරවුල් කිරීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | වූ ණය ශේෂ නිරවුල්කර ගැනීම සඳහා මාස 05 ත් 06 ත් අතර කාලයක් ගත වී තිබුණි. | | |
| (ඇ) | දෙපාර්තමේන්තුව විසින් විශේෂඥ නිලධාරීන් සිය සේවා කාලයෙන් පරිබාහිරව ඉටුකරනු ලබන සේවාවන් වෙනුවෙන් වූ ගාස්තු 2016 වර්ෂයෙන් පසු සංශෝධනය කිරීමක් සිදුකර නොතිබුණි. එසේම රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2015 දෙසැම්බර් 11 දිනැති අංක PFD/04/08/01/59 දරන ලිපිය අනුව ගාස්තු සංශෝධනය වසර තුනකට වරක් සමාලෝචනයකර නිසි පරිදි සංශෝධනය කළ යුතු වුවත්, එසේ කර නොතිබුණි. | 2024 වර්ෂයේදී ගාස්තු සංශෝධනය සම්බන්ධයෙන් ඉල්ලීම් ඉදිරිපත් කිරීමට නියමිත බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඉ) | වැටුප් රහිත නිවාඩු ලබාගෙන විදේශගත වූ දෙපාර්තමේන්තුවේ නිලධාරිනියන් දෙදෙනෙකු නැවත සේවයට වාර්තාකර නොතිබීම හේතුවෙන් එම නිලධාරිනියන් දෙදෙනාගෙන් අයකරගත යුතුව තිබූ රු.2,260,935 ක මුළු දණ්ඩන මුදල අයකර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | මෙම මුදල් අය කරගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා ගරු නීතිපතිතුමා වෙත දන්වා ඇති අතර, ඒ අනුව මෙම නිලධාරීන්ට එරෙහිව නඩු පැවරීමට අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වා තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව එම මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඊ) | විදේශීය වැටුප් සහිත නිවාඩු ලබාගෙන 2021 වර්ෂයේ විදේශ ගත වූ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂකවරයෙකු එරටේදී අසනීපවීම හේතුවෙන් 2022 ඔක්තෝබර් මස නැවත ලංකාවට පැමිණ තිබුණු අතර, එම නිලධාරියාට පාඨමාලා ගාස්තු ඇතුලුව අනෙකුත් වියදම් සඳහා රු.6,281,948 ක මුදලක් වැයවී තිබුණි. මින් පාඨමාලා ගාස්තුව ලෙස ගෙවන ලද රු.5,224,681 ක මුදලින් රු.4,816,556 ක මුදලක් විශ්ව විද්‍යාලය විසින් නැවත ගෙවා තිබූ අතර, ඉතිරි මුදල වූ රු.408,125 ක් සහ ඊට අමතරව දෙපාර්තමේන්තුව විසින් වැයකළ රු.1,057,267 ක මුදල අයකර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. | නිලධාරියාහට ප්‍රතිපූර්ණය කළ යුතුව පවතින වීසා ගාස්තු සහ වෙනත් වියදම් මගින් මෙම මුදල අයකර ගැනීමට කටයුතු කරනු ලබන බවත්, | පාඨමාලාව සඳහා රජයට වැය වූ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (උ) | එමෙන්ම මෙම නිලධාරියා මෙරටට 2022 ඔක්තෝබර් 28 දින පැමිණිය ද, විදේශගත වී සිටි කාල පරිච්ඡේදයට අදාළ නිවාඩු විගණන දිනය වූ 2024 මාර්තු 30 වන විටත් අනුමතකර ගෙන නොතිබුණි. | අදාළ කාලය සඳහා නිවාඩු අනුමැතියට ඉදිරිපත් කරන ලද බව දන්වා තිබුණි. | අදාල කාලයට නිවාඩු අනුමත කර ගැනීමට කටයුතු කල යුතුය |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නඩු භාණ්ඩ විශ්ලේෂණයෙන් අනතුරුව නිකුත් කරන විද්‍යාත්මක වාර්තා මාස 03 ක කාලයක් තුළ ලබාදීම අරමුණ කරගත් කාර්යසාධන දර්ශක හතරක් හඳුන්වාදී තිබුණු අතර, ඉන් එක් දර්ශකයක් ලෙස පෙර වර්ෂවල ලැබුණු විශ්ලේෂණය සඳහා තවදුරටත් ඉතිරිව ඇති නඩු භාණ්ඩ / සාම්පල /පරීක්ෂණවලට අදාළ විශ්ලේෂණ වාර්තා ප්‍රවර්තන වර්ෂය තුළ නිකුත්කර අවසන් කිරීම ඉලක්කකර තිබුණ ද, එම අරමුණ කරා ළඟාවීම සියයට 59 ක් වූ අඩු මට්ටමක පැවතිණි. | දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම සහ 2023 වර්ෂය තුළදී අධික නඩුභාණ්ඩ ප්‍රමාණයක් ලැබීම හේතුවෙන් විශ්ලේෂණ වාර්තා නිකුත් කිරීම ප්‍රමාද වූ අතර, එබැවින් අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීමට නොහැකි වූ දන්වා තිබුණි. | තිරසර සංවර්ධන අරමුණු කරා ළඟාවීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | විද්‍යාගාර දෙකක් නවීකරණය කිරීම සියයට 70 ක ප්‍රගතියක් ඉලක්ක කළ ද, සමාලෝචිත වර්ෂය තුළ එය සියයට 40 ක මට්ටමක පැවතුණි. | විද්‍යාගාර නවීකරණය කොයිකා ආධාර යටතේ සිදුකරනු ලබන අතර, ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව කොයිකා ආයතනය මඟින් තෝරාගත් කොන්ත්‍රාත්කරුවන් මඟින් මෙම නවීකරණ සිදු කරන නිසා ව්‍යාපෘතිය ආරම්භයේදී ලබාදෙන ලද කාලරාමුව අනුව ප්‍රගතිය ඉලක්ක කළ ද, මෙය දෙපාර්තමේන්තුවේ පාලනයෙන් තොර ක්‍රියාවලියක් බව දන්වා තිබුණි. | තිරසර සංවර්ධන අරමුණු කරා ළඟාවීමට කටයුතු කළ යුතු ය. |

## 5. යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (i) වගන්තියට අනුව දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණක තනතුර 2023 වර්ෂයේදී පුරප්පාඩුව පැවති බැවින් අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් අධීක්ෂණය කරනු ලබන බව දන්වා තිබුණි. | විගණන පනතට අනුකූලව කටයුතු කළ යුතු ය. |

### 5.2 විගණන හා කළමනාකරණ කමිටුව

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41(1) සෑම අස්ථිතයක් සඳහාම විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා තිබිය යුතු වුවද, දෙපාර්තමේන්තුව සඳහා එවැනි කමිටුවක් පිහිටුවා නොතිබුණි. | 2024 වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා අදාළ අනුමැතිය සඳහා රේඛීය අමාත්‍යාංශය වෙත යොමුකර ඇති බව දන්වා තිබුණි. | විගණන පනතට අනුකූලව කටයුතු කළ යුතු ය. |

## 6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ආයතනයේ කටයුතු කාර්යක්ෂමව සිදුකිරීමට උපකාරී වන තීරණ ගැනීම සඳහා අවශ්‍ය වන ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 35 ක් හා තෘතීයික මට්ටමේ | ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව 2022 වර්ෂයේ සිට බඳවා ගැනීම සිදු කිරීමට නොහැකි වී ඇති බවත්, අවශ්‍ය අනුමැතිය සඳහා නිරන්තරයෙන්ම රේඛීය | ආයතනයේ අරමුණු, හා ප්‍රධාන කාර්යයන් ඵලදායීව ඉටුකිරීම සඳහා තනතුරුවලට අදාළ කාර්යය මණ්ඩලය බඳවාගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | නිලධාරීන් 10 දෙනෙකුගෙන් 7 දෙනෙකුගේ තනතුරු පුරප්පාඩු වී තිබීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ කටයුතු මනා ලෙස හසුරුවා ගැනීමට එය බාධාවක් වී තිබුණි. | අමාත්‍යාංශය මගින් ඉල්ලීම් සිදු කළ ද, බහු කාර්ය සේවා නිලධාරීන් හැර වෙනත් බඳවාගැනීමක් මෙතෙක් සිදුවී නොමැති බවත්, පුරප්පාඩු විශාල ප්‍රමාණයක් තිබීම නිසා දෙපාර්තමේන්තු කටයුතු මනා ලෙස කළමනාකරණය කරගැනීමට නොහැකි වී ඇති බවත් දන්වා තිබුණි. | |
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018, 6.1 ඡේදය ප්‍රකාරව කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වසරකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු විය යුතු වුව ද, එසේ පුහුණු සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර නොතිබුණි. | නිකුත්කර ඇති චක්‍රලේඛවල සීමාවන්ට යටත්ව දෙපාර්තමේන්තුව සඳහා වෙන්කළ ප්‍රතිපාදන අනුව සේවා අවශ්‍යතාවය ද සැලකිල්ලට ගෙන අත්‍යාවශ්‍ය පුහුණු සහ නොමිලේ පවත්වන පුහුණු සඳහා පමණක් ඉහත සීමිත අවශ්‍යතාවය පරිදි සහභාගී කළ බව දන්වා තිබුණි. | කාර්යය මණ්ඩලයේ ඵලදායීතාවය වැඩිකර ගැනීමට කටයුතු කළ යුතු ය. |